**අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය - 2017**

**-----------------------------------------------------------**

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ 2017 දෙසැම්බර් 31 දිනට ශේෂපත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 1984 අංක 11 දරන අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය පනතේ 12 (4) වගන්තිය සමග සංයෝජිතව කියවියයුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත් කල යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13 (7) (ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් මණ්ඩලයේ සභාපති වෙත 2018 ජුනි 28 දින නිකුත් කරන ලදී.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමණාකරණයේ වගකීම**

**-----------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමණාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

**-----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැළසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත්වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැළකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමණාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-----------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

-----------------

## 2.1 තත්ත්වාගණනය කළ මතය

-------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-------------------------------------------

### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

-------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01

-----------------------------------------------

ප්‍රමිතයේ 95 (ඇ) ඡේදය ප්‍රකාරව 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි දක්වා තිබූ හා රු. 90,687,716 ක් වූ ශුද්ධ වත්කම් / සංචිතවල ස්වභාවය සහ අරමුණ මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07

-----------------------------------------------

ප්‍රමිතයේ 90 ඡේදය ප්‍රකාරව, දේපල පිරියත හා උපකරණ පන්තියක් ප්‍රත්‍යාගණිත අගයන්ට ප්‍රකාශ කර ඇති විට, ප්‍රත්‍යාගණනය ක්‍රියාත්මක වන දිනය, ස්වාධීන තක්සේරුවෙකු යොදා ගත්තේද යන වග හා වත්කම් වල සාධාරණ වටිනාකම් ඇස්තමේන්තු කිරීමේදී ව්‍යවහාර කළ ක්‍රම සහ වැදගත් උපකල්පනයන් හෙළිදරව් කළ යුතුය. එසේ වුවද මණ්ඩලය විසින් මෝටර් වාහන ප්‍රත්‍යාගණන අගයට මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණද ඊට අදාල හෙළිදරව් කිරීම් ඉදිරිපත් කර නොතිබුණි.

### 2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

---------------------------

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරන ප්‍රමිත 9 යෙහි 15 ඡේදය ප්‍රකාරව තොග පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකින් අඩු අගයට දැක්විය යුතු වුවද ආයතනය විසින් තොග පිරිවැයට හඳුනාගැනීමේ ප්‍රතිපත්තියක් අනුගමනය කර තිබුණි.

**2.2.3 පැහැදිලි නොකල වෙනස්කම්**

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශේෂපත්‍රය අනුව ලැබියයුතු ආපදා ණය සහ උත්සව අත්තිකාරම් ශේෂ එකතුව රු. 8,813,971 ක් වුවද මුල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කර තිබුණු උපලේඛන අනුව එම ශේෂ එකතුව රු.8,801,536 ක් වුයෙන් රු. 12,435 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) 2017 දෙසැම්බර් 31 දිනට ලිපිද්‍රව්‍ය වර්ග 51 ක තොග ලේඛනය අනුව ශේෂය රු.834,186 ක් වුවද භෞතික තොග සමීක්ෂණ වාර්තා අනුව එම ශේෂය රු.799,192 ක් වුයෙන් රු.34,994 ක පැහැදිලි නොකල වෙනසක් නිරීක්ෂණය විය.

**2.2.4 අවිනිශ්චිත ගිණුම්**

---------------------

සමාලෝචිත වර්ෂය අවසානයට අවිනිශ්චිත ගිණුමේ රු.480,900 ක ශේෂයක් දක්වා තිබුණු අතර වසර 4 කට අධික කාලයක සිට එය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම්**

-----------------------------------

පහත සඳහන් ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

| | විෂයය | වටිනාකම<br>රු. | ඉදිරිපත් නොකළ විගණන සාක්ෂි |
|---|---|---|---|
| (අ) | පුහුණු වැඩසටහන් වියදම් | 113,100 | පොළොන්නරුව. ගල්ගමුව,මහව හා අනුරාධපුර ප්‍රදේශවල පැවති පුහුණු වැඩසටහන් සඳහා රාජ්‍ය නිලධාරීන් 237 ක් සහභාගී වූ බවට සනාථ කෙරෙන සාක්ෂි. |
| (ආ) | කෙටි පුනරුත්ථාපන කඳවුරු ව්‍යාපෘතියට අදාල වියදම | 1,224,385 | මොරටුව හා රුවන්වැල්ල කඳවුරු සඳහා සහභාගී වූ සේවා ලාභීන්ගේ නාම ලේඛනය |
| (ඇ) | විවිධ තැන්පතු | 36,238 | කාල විශ්ලේෂණ |

**2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

------------------------------------

2017 දෙසැම්බර් 31 දිනට මුල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ රු.1,782,060 ක් වටිනා අත්තිකාරම් ශේෂ වර්ෂ 20 කට වැඩි කාලයක සිට අය නොවී පැවතුණි.

## 2.4 නීති, රීති, රෙගුලාසි සහ කළමණාකරණ තීරණ වලට අනුකූල නොවීම්

පහත සඳහන් නීති රීති, රෙගුලාසි සහ කළමණාකරණ තීරණවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 571 | තැන්පත් කර වසර 5 ඉක්මවා තිබූ තැන්පතු රු.181,800 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ආ) | අංක 03 / 2015 හා 2015 ජූලි 14 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ (ඇ) වගන්තිය | අත්තිකාරම් කාර්යය නිම කල වහාම එම අත්තිකාරම් පියවිය යුතු වුවද සමාලෝචිත වර්ෂයේදී ලබා දී තිබූ රු. 47,800 ක් වූ අත්තිකාරම් අදාල කාර්යය සඳහා වියදම් නොකර දින 07 සිට දින 34 දක්වා වූ කාලයක් අත රඳවාගෙන ආපසු පියවා තිබුණි. |
| (ඇ) | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය | |
| | (i) 2012 අගෝස්තු 08 දින සංශෝධනයන්හි 2.8.1 (ආ) මාර්ගෝපදේශය | සමාලෝචිත වර්ෂයේදී රු.338,215 ක් වූ ෆැක්ස්, යූපීඑස් සහ පොටෝකොපි මිලදී ගැනීම් සඳහා පත් කරන ලද තාක්ෂණ ඇගයීම් කමිටුවට විෂය පිළිබඳ විශේෂඥ දැනුමක් ඇති සාමාජිකයෙකු පත්කර නොතිබුණි. |
| | (ii) අංක 7.12.2(අ) හා (ආ) මාර්ගෝපදේශ | වර්ණ පරිගණක මුද්‍රණ යන්ත්‍ර, ඩිජිටල් කැමරා මිලදී ගැනීමේදී ලංසු ඉදිරිපත්කල එකම ලංසුකරුගෙන් මිලදී ගැනීම සිදුකිරීමට තාක්ෂණික ඇගයීම් කමිටුව තීරණය කර තිබුණද, ජීවිත කාලීන පිරිවැය එනම් නඩත්තු වියදම්, සේවා කිරීම්, වගකීම් කාලය ආදිය හා වට්ටම් පිළිබඳව අවධානය යොමු කර නොතිබුණි. |
| | (iii) 2.5.1(ඊ) මාර්ගෝපදේශය | තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව ප්‍රසම්පාදන කමිටුවකට ඉදිරිපත් කර අනුමත කිරීමෙන් තොරව රු. 63,000 ක් වටිනා වර්ණ මුද්‍රණ යන්ත්‍රයක් මිලදී ගෙන තිබුණි. |
| | (iv) 8.12.3. (අ), (ආ) හා (ඇ) මාර්ගෝපදේශ | සපයන ලද භාණ්ඩ සඳහා ගෙවීම් කිරිමට පෙර ස්ථාන භාර නිලධාරියා විසින් එම භාණ්ඩ පිරිවිතරවලට සහ වෙනත් එකඟ වූ නියමයන්ට අනුකූල බව, සපයා ඇති භාණ්ඩ ප්‍රමාණය කොන්ත්‍රාත් විධිවිධාන වලට අනුකූල බව, එම භාණ්ඩ සඳහා සාමාන්‍යයෙන් සපයනු ලබන වගකීම් සහතික, සුරක්ෂණ සහතික සහ අත්පොත් විශේෂයෙන් එකඟ වූ අයුරු සපයා ඇති බවට සහතිකයක් නිකුත් කල යුතු වුවත් එසේ නොමැතිව පරිගණක හා පැක්ස් යන්ත්‍ර මිල දී ගැනීම වෙනුවෙන් රු. 982,605 ක් ගෙවා තිබුණි. |
| (ඇ) | 1978 දෙසැම්බර් 09 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | වටිනාකම රු.මිලියන 83.3 ක් වූ වත්කම් සඳහා ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් තිබුණද යාවත්කාලීන කර නොතිබුණි. |

**2.5** **ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

------------------------------------------------------------------

ප්‍රසම්පාදන සැලැස්ම ඉක්මවා කරන ලද රු. 4,181,946 ක ප්‍රසම්පාදනයන් සඳහා 2017 ඔක්තෝබර් 31 දින පැවති 178/2017 අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමට යටත්ව අනුමැතිය ලැබී තිබුණද භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමකින් තොරව රු. 348,930 ක් ගෙවීම් කර තිබුණි.

**3.** **මූල්‍ය සමාලෝචනය**

------------------------

**3.1** **මූල්‍ය ප්‍රතිඵල**

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා මණ්ඩලයේ මූල්‍ය ප්‍රතිඵලය රු.34,080,828 ක ඌනතාවක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.37,183,014ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ඌනතාවය රු.3,102,186 කින් අඩු වී තිබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ආදායම රු.6,918,804 කින් අඩු වී තිබුණද වියදම රු.10,020,989 කින් අඩුවීම ඉහත ඌනතාවය අඩුවීම සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේදී රු.6,446,755 ක් වූ ඌනතාවය සමාලෝචිත වර්ෂය අවසානයට රු.34,080,828 ක් දක්වා අඛණ්ඩව පිරිහී තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය නැවත ගැලපීමේදී 2013 වර්ෂයේදී රු.67,539,371 ක් වූ මණ්ඩලයේ දායකත්වය සමාලෝචිත වර්ෂය අවසානයට රු.130,655,747 ක් දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබුණි.

**4.** **මෙහෙයුම් සමාලෝචනය**

----------------------------

**4.1** **කාර්යසාධනය**

-----------------

**4.1.1** **ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය**

--------------------------------------

මණ්ඩලයේ අරමුණු ඉටුකර ගැනීමට අදාලව මණ්ඩලයේ එක් අංශයක් වන ජාතික මාදක රසායනාගාරයේ ක්ෂේත්‍ර 9 ක 2017 දෙසැම්බර් 31 දිනට කාර්යසාධනය සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වීථි හෙරොයින් වල නව තනුකකාරක අඩංගු බවට සිදු කරන විශ්ලේෂණ සියයට 50 කට අඩු මට්ටමක පැවති අතර මත්ද්‍රව්‍ය හා අපරාධ වැළැක්වීමේ කාර්යාලය මගින් ලබා දී ඇති ඊ-අධ්‍යාපන වැඩ සටහන්, මාදක හා මනෝවර්ථක ද්‍රව්‍ය හඳුනා ගැනීම සඳහා නීතිය ක්‍රියාත්මක කරන ආයතන වලට ක්ෂේත්‍ර පරීක්ෂණ කට්ටල සකස් කිරීම සියයට 10 ක් වැනි ඉතා අඩු මට්ටමක පවතින බව නිරීක්ෂණය විය.

(ආ) 2017 වර්ෂයේ ඉටුකරන ලද අතිරේක ආහාරමය නිෂ්පාදන සාම්පල විශ්ලේෂණ සංඛ්‍යාව 13 ක් හා ඇල්කොහොල සාම්පල විශ්ලේෂණ සංඛ්‍යාව 74 ක් ලෙස දක්වා තිබුණද ඒවායේ ඉලක්ක ගත සාම්පල සංඛ්‍යාව සඳහන් කර නොතිබීම හේතුවෙන් ප්‍රගතිය කොපමණද යන්න විගණනයට තහවුරු කර ගත නොහැකි විය.

(ඇ) ක්‍රීඩාවේදී භාවිතා කරන ක්‍රියාකාරීත්ව වර්ධක ඖෂධ වල පරිවෘත්තිය ද්‍රව්‍ය අඩංගු බවට සිදු කරන ලද ජීව විද්‍යාත්මක සාම්පල විශ්ලේෂණය, අධිකරණ කටයුතු සඳහා විද්‍යාත්මක සේවාවන් ලබාදීම හා ශ්‍රී ලංකා රේගුව සඳහා තාක්ෂණික සහය ලබාදීම වැනි කාර්යයන් 2017 වර්ෂයේදී සිදු කර නොතිබුණි.

(ඇ) ප්‍රතිඵලවල නිරවද්‍යතාවය පෙන්වන පරීක්ෂණයේ ප්‍රතිඵල ලැබීමට නියමිතව පවතින බව දක්වමින් එහි කාර්යසාධනය සියයට 100 ක් වන බව දක්වා තිබුණි.

**4.2** **කළමනාකරණ ක්‍රියාකාරකම්**

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) තනතුරකට බඳවාගැනීමේදී නිලධාරියාගේ මූලික සුදුසුකම් පරීක්ෂාකර බැලීම සඳහා අදාල විභාග සහතික අදාල ආයතනවලට යවා සනාථ කර ගත යුතු වුවත් එසේ කර නොතිබුණු අතර නිලධාරීන් 05 දෙනෙකුගේ පෞද්ගලික ලිපිගොනුවල විභාග සහතිකවල සහතික කරන ලද පිටපත් නොතිබුණි.

(ආ) සතුටුදායක සේවා කාලය සැලකීමෙන් හා විභාග සහතික තහවුරු කර ගැනීමෙන් පසු නිලධාරීන්ට උසස්වීම් ලබාදිය යුතු වුවද ඒ පිළිබඳ අවධානය යොමුකිරීමෙන් තොරව නිලධාරීන් හතර දෙනෙකුට උසස්වීම් ලබාදී තිබුණි.

(ඇ) අනුමත බඳවා ගැනීමේ පරිපාටිය ප්‍රකාරව උපදේශන සහකාර ii ශ්‍රේණියට උසස් වී වසර 03 ක් තුල කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් විය යුතු වුවද, ආයතනය විසින් අදාල කාර්යක්ෂමතා කඩඉම් විභාගය නොපවත්වා උපදේශන සහකාර තනතුරට 2013 වර්ෂයේ පත් වී තිබූ නිලධාරීන් 10 දෙනෙකු උපදේශන තනතුරට උසස් කර තිබුණි.

(ඈ) ජාතික මාදක රසායනාගාරයේ තොග පොත් අනුව පැවති රසායනික ද්‍රව්‍ය වර්ග 182 ක් අතුරින් රු.225,624 ක් වටිනා රසායනික ද්‍රව්‍ය වර්ග 12 ක් කල් ඉකුත් වී තිබූ අතර රසායනික ද්‍රව්‍ය වර්ග 58ක් හෙවත් සියයට 32 ක් නිකුත් නොවන තොග වශයෙන්ද, පැවතුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේදී මණ්ඩලය වෙත රු.8,291,965 ක වටිනාකමකට අදාලව නිකුත් කර තිබූ විගණන විමසුම් 02 ක් සඳහා මෙම වාර්තාවේ දින වනවිටද පිළිතුරු ලබාදී නොතිබුණි.

(ඊ) ආයතනය විසින් පුනරාවර්තන වියදම් සඳහා පවත්වා ගෙන යන මුදල් පොත අනුව සමාලෝචිත වර්ෂයේ මාස 08 ක්ම අත ඉතිරි ශේෂය රු.මිලියන 01 සිට රු. මිලියන 4 අතර පරාසයක පැවති අතර මෙම මුදල් ආයතනයේ අරමුණු ඉටුවන පරිදි යොදවා ගැනීමට හෝ ඵලදායී ආයෝජනයන් සිදු කිරීම කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි.

(උ) ව්‍යාපෘති අරමුදල් ව්‍යාපෘති අරමුණු ඉටුකරගැනීම සඳහා උපයෝජනය කරනු වෙනුවට, UNDCP 1995 ව්‍යාපෘතියේ අරමුදලින් රු.1,045,914 ක් හා NDDCB RASH71 ව්‍යාපෘතියේ අරමුදල්වලින් රු.742,547 ක් ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ව්‍යාපෘති අරමුණු වලට පරිබාහිර විදේශ ගමන් සඳහා වැය කර තිබුණි.

(ඌ) මණ්ඩලයේ නිලධාරීන් වෙනුවෙන් සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට ගෙවිය යුතු දායක මුදල් නිසි පරිදි ගණනය නොකිරීම නිසා රු.146,818 ක දඩ මුදලක් ගෙවීමට සිදුවී තිබුණු අතර සේවකයින් 5 දෙනෙකු වෙනුවෙන් සේවක අර්ථසාධක අරමුදලට ගෙවිය යුතු දායක මුදල් නොගෙවීම හේතුවෙන් රු.102,785ක අධිභාර මුදලක් ගෙවීමට සිදුවී තිබුණි.

**4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්**

------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2017 අගෝස්තු සිට ඉදිරි මාස 05 ක ලිපිද්‍රව්‍ය අවශ්‍යතා සලකා බලා මිලදී ගත් රු.394,418 ක ලිපිද්‍රව්‍ය තොගයෙන් 2017 දෙසැම්බර් 31 දිනට රු.318,602 ක ලිපිද්‍රව්‍ය තොගයක් හෙවත් සියයට 81 ක ප්‍රතිශතයක් ඉතිරි වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී මත්ද්‍රව්‍ය භාවිතා කරන්නන් පුනරුත්ථාපනය කිරීම සඳහා කඳවුරු 6 ක් පවත්වා තිබූ අතර එයින් කඳවුරු 3 ක් වෙනුවෙන් වෛද්‍ය සභාවේ පූර්ණ ලියාපදිංචිය හෝ තාවකාලික ලියාපදිංචිය ලබා ගෙන නොමැති වෛද්‍යවරයෙකුගෙන් වෛද්‍ය සේවාව ලබාගෙන ඒ වෙනුවෙන් රු.28,500ක් ගෙවා තිබුණි.

**4.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

-----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලයට අයත් හෝමාගම පිහිටි පිරිවැය රු.2,971,405 ක්වූ පර්චස් 40 ක ඉඩම එලදායී කාර්යයක යොදා ගැනීමකින් තොරව නිෂ්ක්‍රීයව පැවතුණි.

(ආ) 2017 දෙසැම්බර් මාසයේදී ලැබී තිබුණු රු.1,266,768 ක් වටිනා ලී බඩු සඳහා ගෙවීම් කිරීමට 2018 මාර්තු දක්වාම භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවෙන් මුදල් නොලැබීම හේතුවෙන් එකී භාණ්ඩ භාවිතයකින් තොරව මණ්ඩලයේ තැනින් තැන අනාරක්ෂිත හා අපරික්ෂාකාරී ලෙස තබා තිබුණි.

(ඇ) 2017 මාර්තු අවසානයේදී අත්හිටුවන ලද මත්ද්‍රව්‍ය භාවිතා කරන්නන් පුනරුත්ථාපනය කිරීම සඳහා වූ කඳවුරු ව්‍යාපෘතියේ රු.2,220,197 ක් වටිනා උපකරණ, ලීබඩු හා අනෙකුත් භාණ්ඩ සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම නිශ්කාර්යව පැවතුණි.

**4.5 ආර්ථික නොවූ ගනුදෙනු**

--------------------------

2017 ජනවාරි 11 දින මණ්ඩලයේ බඳවා ගැනීමේ පරිපාටිය සංශෝධනය කිරීමෙන් පසු අනුමත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු පිරවීම සඳහා පලකරන ලද පුවත්පත් දැන්වීම් වෙනුවෙන් රු.1,588,213ක් වැයකර තිබුණද 2017 දෙසැම්බර් 31 දිනට තනතුරු නාම 24 ක පුරප්පාඩු 83 ක් සඳහා නිලධාරීන් බඳවා ගෙන නොතිබුණි.

**5. තිරසාර සංවර්ධනය**

------------------------

**5.1 තිරසාර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම**

-------------------------------------------------

තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාළව අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඉහත පරිදි වසර 2030 න්‍යාය පත්‍රය පිළිබඳව අන්තරායකර ඖෂධ පාලක මණ්ඩලය විසින් දැනුවත් වී තිබීම හේතුවෙන් එහි කාර්යයන්ට සම්බන්ධ තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟා විය යුතු සන්ධිස්ථානයන් ද ඉලක්ක මත ළඟාවීම් මැන බැලීම සඳහා වන දර්ශකයන් ද හඳුනා ගැනීමට කටයුතු කර තිබූ බව සඳහන් කර තිබුණද එම අරමුණු ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ආයතනය විසින් නිකුත් කල අභ්‍යන්තර චක්‍රලේඛ/මඟ පෙන්වීම් ආයතනය සතුව නොතිබුණි.

(ආ) කිසියම් කාර්යයක නිවැරදි කාර්යසාධනය මැනීම සඳහා නිවැරදි දත්ත පදනමක් පැවතීම අත්‍යවශ්‍ය වුවත්, ආයතනය විසින් තිරසාර සංවර්ධන ඉලක්කයන්හි ළඟාවීම මැන බැලීම සඳහා නිවැරදි දත්ත පදනමක් බිහිකර ගැනීමට කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය වූ අතර මේ සඳහා පරිගණක, අන්තර්ජාල පහසුකම් වැනි භෞතික පහසුකම් ප්‍රමාණවත් නොවීම හා මූල්‍ය ප්‍රතිපාදන හඳුනාගෙන නොතිබීම යන කරුණු හේතු වී ඇති බව වැඩි දුරටත් නිරීක්ෂණය විය.

(ඇ) තිරසාර සංවර්ධන ඉලක්ක ළඟා කර ගැනීමට අවශ්‍ය සම්පත් හා ධාරිතාවයන් අඛණ්ඩව ලබා ගැනීමට නොහැකි වීමේ අවදානම හඳුනාගෙන නොතිබූ අතර එම අවදානම අවම කිරීම සඳහා ආයතනය විසින් ගතයුතු ක්‍රියාමාර්ගද හඳුනාගෙන නොතිබුණි.

## 6. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

---------------------------------------------

### 6.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

---------------------------------

2003 ජූනි 02 දිනැති අංක පීඊඞී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය අනුව කෙටුම්පත් වාර්ෂික වාර්තාව මුදල් වර්ෂය අවසාන වී දින 60 ක් ඇතුලත විගණකාධිපති වෙත ඉදිරිපත් කලයුතු වුවද සමාලෝචිත වර්ෂයට අදාල කෙටුම්පත් වාර්ෂික වාර්තාව 2018 අගෝස්තු 28 දින වනවිටත් ඉදිරිපත් කර නොතිබුණි.

### 6.2 අභ්‍යන්තර විගණනය

------------------------

මණ්ඩලය විසින් අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර එක් නිලධාරියෙක් අනුයුක්ත කර තිබුණද 2017 වර්ෂය සඳහා විගණන වැඩසටහන පිළියෙල කර නොතිබුණි. 2003 ජූනි 02 දිනැති පීඊඞී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 3.7.5 ඡේදය ප්‍රකාරව ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.

### 6.3 ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

------------------------------------------

#### 6.3.1 ප්‍රසම්පාදනයන්

-----------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.5.1 මාර්ගෝපදේශය ප්‍රකාරව ප්‍රසම්පාදන කමිටුවක් විසින් තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව නිර්දේශ කිරීම හා සමාලෝචනය කිරීම කලයුතු වුවද රු.171,375 ක්වූ ගෘහස්ථ පාරිභෝජන ද්‍රව්‍ය මිලදී ගැනීමේදී එසේ නිර්දේශ නොකරන ලද තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව මත පරිපාලන නිලධාරී විසින් ඇණවුම ලබා දී තිබුණි.

(ආ) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (ආ) වගන්තිය ප්‍රකාරව අවම වශයෙන් වසර තුනක (03) කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ඇතුලත් කර ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කල යුතු වුවත් මණ්ඩලය විසින් 2017 වර්ෂය සඳහා පමණක් ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර තිබුණි.

(ඇ) 2017 වර්ෂයට අදාල ප්‍රසම්පාදන සැලැස්ම 2017 ජුනි 29 දින සංශෝධනය කර තිබූ අතර එම සැලැස්ම අනුව 2017 වර්ෂයේ මුළු ප්‍රසම්පාදනය සඳහා රු.42,240,000 ක් ඇස්තමේන්තු කර තිබුණි. එසේ වුවද රු.2,744,172 ක් හෙවත් ඇස්තමේන්තුගත මුදලින් සියයට 6.5 ක් පමණක් වැය කර තිබුණු අතර සියයට 93.5 කට අදාල ප්‍රසම්පාදන කටයුතු සිදු කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුලදී ක්‍රියාත්මක කිරීමට සැලසුම්කර තිබූ ඇස්තමේන්තු වටිනාකම රු.18,150,000 ක්වූ ඉදිකිරීම් ප්‍රසම්පාදන කාර්යයන් කිසිවක් ඉටුකර නොතිබුණු අතර ප්‍රසම්පාදන සැලැස්මට ඇතුලත් කර නොතිබුණු රු.443,695 ක ඉදිකිරීම් කටයුතු නිමකර මුදල් ගෙවා තිබුණි.

## 6.4 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂයේ අයවැයගත නොවූ වියදම් විෂයයන් 15 ක් සඳහා එකතුව රු.23,245,931ක් වැයකර තිබූ අතර අයවැයගත වැය විෂයන් 10 කට අදාලව ඇස්තමේන්තු ගත රු.68,923,000 කින් කිසිදු වියදමක් දරා නොතිබුණි. තවද වැය විෂයයන් 16 කට අදාළව සියයට 50 සිට සියයට 100 ක් දක්වා වූ විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබූ බව විගණනයේදී නිරීක්ෂනය විය.

## 7. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | වත්කම් පාලනය | ස්ථාවර වත්කම් ලේඛනය විධිමත්ව නඩත්තු නොකිරීම |
| (ආ) | මූල්‍ය කළමනාකරණය | අක්‍රිය බැංකු ගිණුම්වල පවතින ශේෂ ඵලදායී කාර්යන් සඳහා උපයෝජනය නොකිරීම. |
| (ඇ) | මානව සම්පත් කළමනාකරණය | අනුමතකාර්ය මණ්ඩලයේ පුරප්පාඩු පිරවීමට කටයුතු කර නොතිබීම. |
| (ඈ) | වියදම් පාලනය | සැලසුම් නොකල කාර්යයන් ඉටුකිරීම |
| (ඉ) | ප්‍රසම්පාදනය | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු නොකිරීම. |
| (ඊ) | තොග පාලනය | තොග අවශ්‍යතාවය හඳුනාගෙන මිලදී ගැනීමට කටයුතු නොකිරීම |
| (උ) | ලිපිගොනු පාලනය | පෞද්ගලික ලිපිගොනුවල සහතික කරන ලද විභාග සහතික නොමැතිවීම හා තනතුරු සඳහා බඳවා ගැනීමේදී අදාල ආයතන මගින් විභාග සහතික සනාථ කරගෙන නොතිබීම. |